# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1831/20 - 2013 ඔක්තෝබර් මස 09 වැනි බදාදා - 2013.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

එල්. ඩී. බී. 277/40.

19 වන වගන්තිය යටතේ වූ දැන්වීම

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්ය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ස්මාරකය, ආරක්ෂිත ස්මාරකයක් බවට ප්‍රකාශයට පත්කරමින් එම ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ජගත් බාලසූරිය වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා 2013.10.23 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු ය.

එවැනි සෑම විරෝධතාවයක් ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එම විරෝධතාව ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද, එම හේතු පිළිබඳ ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතුය.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

*ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ස්මාරක ලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණ තල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ (ග්‍රා.නි. වසම් අංක 697) පිහිටි, තල්පිටිය ග්‍රාමයට අයත් දළදාවත්ත පුරාණ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමාගෘහය සහ ධර්මශාලාව.

10 - 755

1A - G 18372 — 155 (2013/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*